# මිලිඳු රාජ ප්‍රශ්නය



**සරල සිංහල පරිවර්තනය**

අතිපූජ්‍ය කිරිබත්ගොඩ ඤාණානන්ද ස්වාමීන් වහන්සේ

# 15. ප්‍රඥාවේ ස්වභාවය ගැන ප්‍රශ්නය

මිළිඳු රජ තෙමේ මෙසේ ඇසුවේය.

“ස්වාමීනී, නාගසේනයන් වහන්ස, ප්‍රඥාවේ ස්වභාවය කුමක්ද?”

“මහරජාණෙනි, මා විසින් ඔය කරුණ පවසා නොතිබෙන්නේ ද? සිඳබිඳ දැමීමේ ස්වභාවය ප්‍රඥාවයි. එමෙන් ම ආලෝකය ඉපිද වීමේ ස්වභාවයත් ප්‍රඥාවයි.”

“ස්වාමීනී, ප්‍රඥාව ආලෝකය ඉපිදවීමේ ස්වභාවයෙන් යුක්ත වන්නේ කෙසේද?”

“මහරජාණෙනි, ප්‍රඥාව උපදින කල්හී අවිද්‍යා අන්ධකාරය දුරු වෙයි. විද්‍යා ආලෝකය හටගනී. අවබෝධ ඤාණය නම් වූ ආලෝකය ප්‍රකට වෙයි. ආර්ය සත්‍යය ඉතා හොඳින් පැහැදිලි වෙයි. ඒ තුළින් ය යෝගාවචර තෙමේ අනිත්‍ය වශයෙන් වේවා, දුක් වශයෙන් වේවා, අනාත්ම වශයෙන් වේවා, සම්‍යක් ප්‍රඥාවෙන් යථාර්ථය දකින්නේ.”

“ස්වාමීනී, උපමාවක් වදාළ මැනැව.”

“මහරජාණෙනි, එය මෙවැනි දෙයකි. අන්ධකාර නිවසකට පුරුෂයෙක් පහනක් රැගෙන ඇතුළු වෙයි. පහන් එළිය ඇතුළට පිවිසෙද්දීම අර අඳුර දුරු වී යයි. එළිය උපදියි. ආලෝකය පැතිරෙයි. නිවසේ ඇති රූප ආදිය ප්‍රකටව පෙනෙයි.

මහරජාණෙනි, ඔය අයුරින් ම ප්‍රඥාව උපදින කල්හී අවිද්‍යා අන්ධකාරය දුරු වෙයි. විද්‍යා ආලෝකය හටගනී. අවබෝධ ඥාණය නම් වූ ආලෝකය ප්‍රකට වෙයි. ආර්ය සත්‍යය ඉතා හොඳින් පැහැදිලි වෙයි. ඒ තුළින් ය යෝගාවචර තෙමේ අනිත්‍ය වශයෙන් වේවා, දුක් වශයෙන් වේවා, අනාත්ම වශයෙන් වේවා, සම්‍යක් ප්‍රඥාවෙන් යථාර්ථය දකින්නේ. ඔය අයුරින් ය මහරජාණෙනි, ආලෝකය ඇතිකරවන ස්වභාවයෙන් යුතුව ප්‍රඥාව තිබෙන්නේ.”

“ස්වාමීනී නාගසේනයන් වහන්ස, ඉතා දක්ෂ වන සේක.”

පහළොස්වෙනි ප්‍රඥාවේ ස්වභාවය ගැන ප්‍රශ්නයයි.

තෙරුවන් සරණයි!

සරල සිංහල පරිවර්තනය

**පූජ්‍ය කිරිබත්ගොඩ ඤාණානන්ද
පින්වත් ලොකු ස්වාමීන් වහන්සේ විසිනි.**

පින්වත් ලොකු ස්වාමීන් වහන්සේට
මාගේ නමස්කාරය වේවා!

උතුම් වූ ධර්මදානය පිණිස මෙම දෙසුම ඔබේ
මිතුරන් අතරේ බෙදාහරින්න.